# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන)

**1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

ධීවර අමාත්‍යතුමා විසින් 2023 ජූලි මස 05 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2023 පෙබරවාරි මස 28 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[183 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 18.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය* :** මේ වගන්තිය මගින් (මෙහිමින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 14ඊ වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, ප්‍රතියෝජිත පරිදි වූ එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ මේ පනතේ II වන කොටස යටතේ ප්‍රදානය කරන ලද බලපත්‍රයක් දරන්නාට අමතරව බෝට්ටුවේ අයිතිකරු, බෝට්ටුවේ නියමුවා, කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයකු සහ අදාළ අවස්ථාවේ දී එම බෝට්ටුවේ සිටින යම් තැනැත්තකු අලුතින් හඳුන්වා දෙන ලද 14ඊ වගන්තිය යටතේ වන වරද සිදුකිරීම සම්බන්ධයෙන් වගකිවයුතු තැනැත්තන් බවට පත් කිරීම ය.

***3 වන වගන්තිය* :** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 14ච සහ 14ජ යන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර:–

(1) 14ච වගන්තියේ නීතියේ බලපෑම වනුයේ-

(අ) යම් තැනැත්තකු ශ්‍රී ලංකා ජල තීරයේ හෝ මහ මුහුදේ යම් නීතිවිරෝධී, වාර්තා නොවූ සහ අවිධිමත් ධීවර මෙහෙයුම්වල නිරත වීම තහනම් කිරීම; සහ

(ආ) අලුතින් ඇතුළත් කරන ලද 14ච වගන්තිය යටතේ සිදුකරන ලද වරදක් සඳහා බෝට්ටුවේ අයිතිකරු, බලපත්‍රය දරන්නා, බෝට්ටු නියමුවා, කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයකු සහ අදාළ අවස්ථාවේ දී එම බෝට්ටුවේ සිටි යම් තැනැත්තකු වගකිවයුතු තැනැත්තන් බවට පත්කිරීම ය.

(2) 14ජ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ වෙනත් රටක දේශීය අධිකරණ බල සීමාව තුළ පිහිටි ජල තීරයේ නීති විරෝධී, වාර්තා නොවූ සහ අවිධිමත් ධීවර මෙහෙයුම්වල නිරත වන තැනැත්තන් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී යම් දේශීය ධීවර බෝට්ටුවක ලියාපදිංචිය සහ ධීවර මෙහෙයුම් සඳහා වන බලපත්‍රය අවලංගු කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම ය.

***4 වන වගන්තිය* :** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 16අ වගන්තිය ඉවත් කරනු ලැබේ.

***5 වන වගන්තිය* :** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ මේ පනතේ 49 (4) වන වගන්තිය යටතේ සිදුකරන ලද වරදක් සම්බන්ධයෙන් ධීවර බෝට්ටුවේ දිග ප්‍රමාණය මත පදනම්ව පනවනු ලබන දඩ මුදල වැඩිකිරීම සහ 49 (4අ) වන වගන්තියේ සඳහන් යම් තැනැත්තකු සම්බන්ධයෙන් 49 (4) වන වගන්තියේ අදාළත්වය බැහැර කොට වෙනම දඩ මුදලක් පනවනු ලැබීම සඳහා විධිවිධාන සැලැස්වීම ය.

***6 වන වගන්තිය* :** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 49ආ සහ 49ඇ යන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර එම වගන්තිවල නීතියේ බලපෑම වනුයේ ප්‍රධාන ප්‍රඥප්තියේ 14ච වගන්තිය හෝ (ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ සාදන ලද යම් නියෝගයක් හැර) ප්‍රධාන ප්‍රඥප්තියේ වෙනත් යම් විධිවිධානයක් උල්ලංඝනය කරනු ලබන යම් තැනැත්තකු සම්බන්ධයෙන් මේ පනතේ ප්‍රකාශිතව දණ්ඩනයක් සඳහන් කර නොමැති අවස්ථාවක දී දණ්ඩනයක් පැනවීම සඳහා විධිවිධාන සැලැස්වීම ය.

***7 වන වගන්තිය* :** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ:–

(අ) "බලයලත් නිලධරයා",යන යෙදුමේ අර්ථ නිරූපණයෙහි වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවේ යම් වෙරළාරක්ෂක නිලධරයකු යන්න ඇතුළත් කිරීම ය;

(ආ) "නීති විරෝධී, වාර්තා නොවූ සහ අවිධිමත් (IUU) ධීවර මෙහෙයුම්" සහ "නියමුවා"යන යෙදුම් සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ අලුත් අර්ථ නිරූපණ ඇතුළත් කිරීම ය.

## ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන)

එල්.ඩී.–ඕ. 1/2021

### 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2023 අංක      දරන ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1996 අංක 2 දරන පනතේ 14ඊ වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 14ඊ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"විදේශීය ජල තීරයන්හි මසුන් ඇල්ලීම තහනම් කිරීම

14. ඊ (1) යම් රාජ්‍යයක නීතිවලට අනුකූලව එසේ කිරීමට බලය දී ඇත්නම් මිස, යම් තැනැත්තකු විසින්, මේ කොටස යටතේ බලපත්‍රයක් ප්‍රදානය කර ඇති දේශීය ධීවර බෝට්ටුවක් වෙනත් යම් රාජ්‍යයක දේශීය අධිකරණ බලසීමාව තුළ පිහිටි ජල තීරය තුළ ධීවර මෙහෙයුම් සඳහා භාවිත කිරීම හෝ භාවිත කිරීමට සැලැස්වීම නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරනු ලබන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

(3) මේ වගන්තියේ කාර්යය සඳහා, යම් තැනැත්තකු යන්නට බෝට්ටුවේ අයිතිකරු, එම බෝට්ටුව සඳහා නිකුත් කරන ලද බලපත්‍රය දරන්නා, බෝට්ටුවේ නියමුවා, එහි කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයකු සහ එම වරද සිදු කරන ලද අවස්ථාවේ දී එම බෝට්ටුවේ ගමන් කළ යම් තැනැත්තකු ද ඇතුළත් විය යුතු ය:

එසේ වුව ද, එම බෝට්ටුවේ ගමන් කළ යම් තැනැත්තකු විසින්, එම වරද සිදු කරන ලද්දේ තමාගේ දැනීමෙන් තොරව බවට හෝ එම වරද සිදුවීම වැළැක්වීම සඳහා තමා විසින් සියලු නිසි උද්යෝගයෙන් ක්‍රියා කළ බවට ඔප්පු කරනු ලැබුවහොත් එම වරද සඳහා එම බෝට්ටුවේ ගමන් කළ එවැනි යම් තැනැත්තකු වරදකරු වන බවට සලකනු නොලැබිය යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ IIඅ කොටසට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් කොටස මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ IIආ කොටස ලෙස බලාත්මකව පැවතිය යුතු යః-

ප්‍රධාන ප්‍රඥප්තියේ IIආ අලුත් කොටස ඇතුළත් කිරීම

"IIආ කොටස

ශ්‍රී ලංකා ජල තීරයේ හෝ මහ මුහුදේ නීති විරෝධී, වාර්තා නොවූ හෝ අවිධිමත් මසුන් ඇල්ලීමේ කටයුතු තහනම් කිරීම

14ච. (1) යම් තැනැත්තකු විසින් ශ්‍රී ලංකා ජල තීරයේ හෝ මහ මුහුදේ යම් නීති විරෝධී, වාර්තා නොවූ හෝ අවිධිමත් ධීවර මෙහෙයුම්වල නිරත නොවිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරනු ලබන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

(3) මේ වගන්තියේ කාර්යය සඳහා, යම් තැනැත්තකු යන්නට, බෝට්ටුවේ අයිතිකරු, එම බෝට්ටුව සඳහා නිකුත් කරන ලද බලපත්‍රය දරන්නා, බෝට්ටුවේ නියමුවා, එහි කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයකු සහ එම වරද සිදු කරන ලද අවස්ථාවේ දී එම බෝට්ටුවේ ගමන් කළ යම් තැනැත්තකු ද ඇතුළත් විය යුතු ය:

එසේ වුව ද, එම බෝට්ටුවේ ගමන් කළ යම් තැනැත්තකු විසින්, එම වරද සිදු කරන ලද්දේ තමාගේ දැනීමෙන් තොරව බවට හෝ එම වරද සිදුවීම වැළැක්වීම සඳහා එම තැනැත්තා විසින් සියලු නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කළ බවට ඔප්පු කරනු ලැබුවහොත් එම වරද සඳහා එම බෝට්ටුවේ ගමන් කළ එවැනි යම් තැනැත්තකු වරදකරු වන බවට සලකනු නොලැබිය යුතු ය.

ධීවර මෙහෙයුම් සඳහා වන ධීවර බෝට්ටු ලියාපදිංචි කිරීම සහ ධීවර මෙහෙයුම්වල නිරත වීම සඳහා නිකුත් කළ බලපත්‍රය අවලංගු කිරීම ආදිය

14ජ. අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, වෙනත් රටක අධිකරණ බලප්‍රදේශය තුළ පිහිටි ජල තීරයේ නීති විරෝධී, වාර්තා නොවූ හෝ අවිධිමත් ධීවර මෙහෙයුම්වල යම් තැනැත්තකු නිරත වී සිටින බවට සහ ඒ මෙහෙයුම් සඳහා භාවිත කළ ධීවර බෝට්ටුව 15 වන වගන්තිය යටතේ ලියාපදිංචි කළ දේශීය ධීවර බෝට්ටුවක් බවට විශ්වාස කිරීමට ඔහුට සාධාරණ හේතු ඇති අවස්ථාවක දී අවස්ථාවෝචිත පරිදි, ඒ තැනැත්තාට හෝ එම බෝට්ටුවේ අයිතිකරුට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා දීමෙන් පසුව-

(අ) 15 වන වගන්තිය යටතේ දේශීය ධීවර බෝට්ටුවක් ලෙස ඒ බෝට්ටුව ලියාපදිංචි කරනු ලැබ තිබීම අවලංගු කිරීම හෝ ඔහු විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි යම් කාලසීමාවක් සඳහා එහි ලියාපදිංචිය අත්හිටුවීම; සහ

(ආ) අවස්ථාවෝචිත පරිදි, 6 වන වගන්තිය හෝ 14අ වගන්තිය යටතේ, බලපත්‍රලාභියකුට අවස්ථාවෝචිත පරිදි, ශ්‍රී ලංකා ජල තීරයේ හෝ මහ මුහුදේ යම් නියම කරන ලද ධීවර මෙහෙයුම්වල නිරත වීමට බලය පවරමින් එම ධීවර බෝට්ටුව සඳහා නිකුත් කරන ලද යම් බලපත්‍රයක් අවලංගු කිරීම හෝ ඔහු විසින් නිශ්චය කරනු ලබන යම් කාලසීමාවක් සඳහා අත්හිටුවීම,

කරනු ලැබිය හැකි ය.”.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 16අ වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 16අ වගන්තිය ඉවත් කිරීම

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එම වගන්තියේ (4) වන උපවගන්තියේ “යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර” යන වචනවල සිට එම වගන්තිය අවසන් වන තෙක් ඇති සියලු වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරනු ලැබේ:-

“යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, මෙහි උපලේඛනයේ I වන තීරයේ අනුරූප සටහනෙහි නිශ්චිතව දක්වා ඇති ධීවර බෝට්ටුවේ දිග සැලකිල්ලට ගනිමින් නිශ්චය කරනු ලබන, එම උපලේඛනයේ II වන තීරයේ නිශ්චිතව දක්වා ඇති මුදල් ප්‍රමාණවලට අඩු නොවන දඩයකට ඔහු යටත් විය යුතු ය:-

### උපලේඛනය

| I වන තීරය බෝට්ටුවේ දිග | II වන තීරය දඩ මුදල |
|---|---|
| මීටර් 10.3 සිට මීටර් 15 ට අඩු | රුපියල් 50,000 |
| මීටර් 15 සිට මීටර් 24 ට අඩු | රුපියල් 100,000 |
| මීටර් 24 සිට මීටර් 45 ට අඩු | රුපියල් 500,000 |
| මීටර් 45 සිට මීටර් 75 දක්වා | රුපියල් මිලියන 1 |
| මීටර් 75 ට වැඩි | රුපියල් මිලියන 5.”. |

(2) එම වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

“(4අ) (4) වන උපවගන්තියේ කුමක් සඳහන් වුව ද, ධීවර බෝට්ටුවක් හා සම්බන්ධ නොවන ධීවර ආරාවුලක පාර්ශ්වකරුවකුව, 44 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ බලයලත් නිලධරයකු ඉදිරියේ පෙනී සිටින ලෙස කැඳවනු ලැබූ අවස්ථාවක දී එසේ පෙනී සිටීම පැහැර හරිනු ලබන හෝ 44 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ඇතුළත් වූ ධීවර බෝට්ටුවක් හා සම්බන්ධ නොවන බේරුම් කිරීමක පාර්ශ්වකරුවකුව, එම බේරුම් කිරීමේ නියමයන් පිළිපැදීම පැහැර හරිනු ලබන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පනස්දහසකට අඩු නොවන දඩයකට ඔහු යටත් විය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 49ආ සහ 49ඇ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 49අ වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා ප්‍රධාන ප්‍රඥප්තියේ 49ආ සහ 49ඇ වන වගන්ති ලෙස බලාත්මකව පැවතිය යුතු යː-

“ශ්‍රී ලංකා ජල තීරයේ හෝ මහ මුහුදේ නීති විරෝධී, වාර්තා නොවූ හෝ අවිධිමත් ධීවර කටයුතු සඳහා වන දණ්ඩනය

49ආ. මේ පනතේ 14ච වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරනු ලබන හෝ එම විධිවිධාන පිළිපැදීම පැහැර හරිනු ලබන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර පනතේ එකී වරද සඳහා කිසිදු දණ්ඩනයක් ප්‍රකාශිතවම සලස්වා නොමැති නම්, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂයකට අඩු නොවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

කිසිදු දණ්ඩනයක් ප්‍රකාශිතව සලස්වා නොමැති වැරදි සඳහා වන දණ්ඩනය

49ඇ. 49ආ වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, කිසිදු දණ්ඩනයක් සඳහා ප්‍රකාශිතව විධිවිධාන සලස්වා නොමැති වන්නේ (මේ පනත යටතේ සාදන ලද යම් නියෝග හැර) මේ පනතේ යම් විධිවිධානයක් සම්බන්ධයෙන් ද එකී යම් විධිවිධානයක් උල්ලංඝනය කරනු ලබන හෝ එම විධිවිධාන පිළිපැදීම පැහැර හරිනු ලබන යම් තැනැත්තකු, වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පනස්දහසකට අඩු නොවන දඩයකට ඔහු යටත් විය යුතු ය.”.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනුලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) “බලයලත් නිලධරයා” යන යෙදුමේ අර්ථ නිරූපණයේ “පොලිස් නිලධරයකු හෝ සුළු නිලධාරි නිලයට පහළ නොවූ නිලයක් දරන නාවුක හමුදා නිලධරයකු” යන වචන වෙනුවට “පොලිස් නිලධරයකු, සුළු නිලධාරි නිලයට පහළ නොවූ නිලයක් දරන නාවුක හමුදා නිලධරයකු හෝ 2009 අංක 41 දරන වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව පනත මගින් පිහිටුවන ලද වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ යම් වෙරළ ආරක්ෂක නිලධරයකු” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) “මහ මුහුද” යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:-

““නීති විරෝධි, වාර්තා නොවූ සහ අවිධිමත් (IUU) ධීවර මෙහෙයුම්” යන්නට, ඉන්දියන් සාගර ටූනා කොමිෂන් සභාවේ යෝජනා සම්මතයක් මඟින් පිළිගනු ලැබ ඇති පරිදි එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) විසින් සම්මත කරනු ලැබ ඇති, 2009 නීති විරෝධි, වාර්තා නොවූ සහ අවිධිමත් ධීවර කටයුතු වැළැක්වීමට, නතර කිරීමට සහ පිටුදැකීමට වරාය සහිත රාජ්‍යයන්වල පියවර පිළිබඳ ගිවිසුම මඟින් සම්මත කරන ලද නීති විරෝධි, වාර්තා නොවූ සහ අවිධිමත් ධීවර කටයුතු

වැළැක්වීම, නතර කිරීම සහ පිටුදැකීම සඳහා වූ ජාත්‍යන්තර ක්‍රියාකාරී සැලැස්මේ (IUU ධීවර කටයුතු පිළිබඳ ක්‍රියාකාරී සැලැස්ම) 3 වන ඡේදයේ දක්වා ඇති ධීවර මෙහෙයුම්, ශ්‍රී ලංකාව පාර්ශ්වකරුවකු වන්නා වූ වෙනත් අදාළ කලාපීය ධීවර කළමනාකරණ සංවිධාන (RFMO) මඟින් සම්මත කරන ලද කළමනාකරණ සහ සංරක්ෂණ පියවර උල්ලංඝනය කරමින් සිදු කරනු ලබන ධීවර මෙහෙයුම් සහ අදාළ වන්නා වූ ජාත්‍යන්තර නීතිවල අදාළ විධිවිධාන යටතේ ජීවී මුහුදු සම්පත් සංරක්ෂණය කිරීම සඳහා වන ශ්‍රී ලංකාවේ බැඳීම් උල්ලංඝනය කරමින් සිදු කරනු ලබන ධීවර මෙහෙයුම් ඇතුළත් වේ;";

(3) "එක් ස්ථානයක වාසය කරන සත්ව විශේෂ" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:-

""නියමුවා" යන්නෙන්, ධීවර යාත්‍රාවක ගමන් මාර්ගය පිළිබඳ උපදෙස් ලබා දෙන, අල්ලාගත් මත්ස්‍ය ප්‍රමාණය තක්සේරු කර වාර්තා කරනු ලබන සහ යාත්‍රාවේ කාර්ය මණ්ඩලය කළමනාකරණය කරනු ලබන එකී ධීවර යාත්‍රාවේ අණදෙන තැනැත්තා අදහස් වේ. නෞකාවේ සිටින නෞකාධිපතිවරයා හෝ කපිතාන්වරයා ද නියමුවකු ලෙස සේවය ලබා දෙන ලෙස සලකනු ලැබේ.".

8. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව